# ශ්‍රී ලාංකේය කාන්තාවගේ අභිවෘද්ධිය කෙරෙහි "සිහල කුලඟන" පුවත්පතේ දායකත්වය

*එච්.එස්.එච්. සමරවිල*

ලංකාවේ පුවත්පත් පිළිබඳ ඉතිහාසය දිගු අතීතයට හිමිකම් කියයි. මෙසේ ඇරඹි පුවත්පත් ඉතිහාසයේ 1916 වසරේ "සිහල කුලඟන" නමින් පුවත්පතක් ආරම්භ කර ඇත. මෙහි සුවිශේෂීත්වය නම් කාන්තා අභිවෘද්ධිය අරමුණු කරගෙන තිබීමයි. සමාජයේ එක්කොටසක නගාලීමට පුවත්පතක් පලවීම මෙහි සුවිශේෂීත්වයයි. මෙරට කාන්තාවගේ අභිවෘද්ධිය කෙරෙහි "සිහල කුලඟන" පුවත්පත මගින් සිදුවූ දායකත්වය හදුනා ගැනීම මෙම පර්යේෂණයේ අරමුණයි. සමකාලීන කාන්තා සමාජයේ අභිවෘද්ධියක් සිහල කුලඟන පුවත්පතින් සිදුවී තිබේ ද යන්න මෙම පර්යේෂණයේ ගැටලුවයි. මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික මූලාශ්‍රය ලෙස "සිහල කුලඟන" පුවත්පත භාවිතා කළ අතර එහිදී 1916 ජුනි සිට නොවැම්බර් මස දක්වා පුවත්පත් අධ්‍යයනය කෙරිණි. මෙම පර්යේෂණය මගින් විදේශයන්ගේ පාලනයන්ට නතුවීම නිසාවෙන් සිදුවූ පරිහානියෙන් මුදා ගැනීමට කාන්තාව වෙත අවධානය යොමු කර ඇති ආකාරය හඳුනා ගත හැකිය. ස්වකීය භාෂාව පවා දෙවැනි තැනට දමා ඇති බව, බාහිර අලංකරණයට මුල්තැන දී ඇති බව කරුණු මගින් හෙළිවේ.කාන්තා අභිවෘද්ධියට විවිධ තේමා ඔස්සේ ලිපි මෙහි පළකර ඇති අයුරු දැකගත හැකිය. එනම් " ස්ත්‍රී රත්නය, රූප සෞන්දර්‍ය්‍යය, සුවිනීත බව, ඉවසීම" ආදිය මෙයට නිදසුන් ය. එසේම කාන්තාව වෙනුවෙන් කවි පන්ති පළ කර ඒ ඔස්සේ ද සමාජ ඉදිරිගමනට අවශ්‍ය දායකත්වය ඉස්මතු කර ඇත. සමස්ත සමාජයේ වෙනස්වීම සිදුවූ ආකාරය මේ අයුරින් පැහැදිලි වේ. කාන්තාවන් දිරිගැන්වීම සඳහා උපදෙස් වාක්‍ය සහ කුලඟනන් උදෙසා ත්‍යාග පිළිබඳව පුවත්පත මගින් පළකර තිබේ. මෙහි ආකෘතිය ගත්විටද මුල් සිතුවම කාන්තාවන්ගේ ජීවිතය සම්බන්ධ ක්‍රියාකාරකම් ඇසුරින් නිර්මාණය කරන ලද්දකි. මෙහි පරමාර්ථය කාන්තා පක්ෂයේ දියුණුව බලාපොරොත්තුව බව සඳහන් කර තිබීමෙන් කාන්තා පක්ෂයේ දියුණුවට දැක්වූ දායකත්වය පැහැදිලි වේ. පරිහානිකර සමාජයෙන් කාන්තාව මුදිගැනීමට ගත් උත්සහය නිසාවෙන් පුවත්පත අගය කළ හැකිය .පුවත්පතක් මාධ්‍ය කරගෙන මෙසේ කාන්තා පක්ෂයේ දියුණුවට විශාල දායකත්වයක් දක්වා ඇතිබව මෙයින් නිගමනය කළ හැකිය.

***ප්‍රමුඛ පද:*** අභිවෘද්ධිය, කාන්තාව, පුවත්පත, සමාජය ,සිහල කුලඟන